SINHALI - Sri Lanka
HIGHLIGHTS LIFE CHRIST



# ක්‍රිස්තු ජීවිතයේ ප්‍රධාන සිද්ධීන්

## 1

### යේසුස්වහන්සේ - දෙවියන් වහන්සේගේ උතුම්ම ත්‍යාගය

- උසස්ම ත්‍යාගය
- දෙවියන්වහන්සේගේ පොරොන්දුව
- දේව දූතයා සහ මරියා
- මරියා සහ එළිසබෙත්
- දේව දූතයා සහ යෝසෙප්
- බෙත්ලෙහෙමේ උපත

## පිළිගැනීමයි !

ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතන පවුලට ඔබව සාදරයෙන් පිළිගනිමු. ක්‍රිස්තුස්වහන්සේගේ අනගි ජීවිතය පිළිබඳව ලියවී ඇති මෙම පාඩම් ඔබට රසවත් වේයැයි අපි බලාපොරොත්තු වෙමු. මෙම පාඩම අවසන් කළ පසු අටවෙනි පිටුවෙහි වෙන්කර ඇති ස්ථානයේ ඔබේ නම සහ ලිපිනය ලියන්න. ඉන්පසුව එහි දී ඇති ලිපිනයට මෙම පොත් පිංච තැපැල් කරන්න. ඔබේ පිළිතුරු පත් ශ්‍රේණි ගතකර දෙවන පාඩම සමඟ ආපසු එවන්නෙමු. සයවෙනි පාඩම අවසානයේදී ඔබට අලංකාර සහතික පත්‍රයක් ලැබෙනවා ඇත.

## උසස්ම ත්‍යාගය



ඔබ පතන ඕනෑම දෙයක් ඔබට ලැබේ නම් ඔබ තෝරාගන්නේ කුමක් ද? බොහෝ දෙනා ධනවත්වීමට ඉල්ලන් නට පුළුවන. තවත් සමහරෙක් නිරෝගි කම, ප්‍රීතිය හෝ මිත්‍රත්වය එනම් මුදලට ලබාගත නොහැකි දේ පැතිය හැකිය.

ඔබ කිසිදිනක අවසන් නොවන ප්‍රීතිය ඉල්ලා සිටිය හැක. නමුත් ඔබට සදකාලයටම ජීවත්වීමට සලසා දිය හැක්කේ කවරෙකුටද? ඔබට සදකාල ප්‍රීතිය ලබාදිය හැක්කේ ඔබව සාදා ඔබට ජීවනය දුන් තැනන්වහන්සේට පමණකි. එනම් අහසත් පොළවත් එහි තුල තිබෙන සියල්ලත් සෑදූ දෙවියන් වහන්සේය.

සදාකාල ප්‍රීතිය යනු ඔබ ආශාවිය යුතු දෙයක් පමණක්ම නොවේ. දෙවියන්වහන්සේ ඔබට බොහෝ සේ ප්‍රේම කරන නිසා උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්සේ ඔබේ මිත්‍රයකුවීමට එව්සේක. උන්වහන්සේව පිළිගන්න අයට සදාකාලික ප්‍රීතිය අත්වේ. එම නිසා ඔබට ලබාගත හැකි උතුම්ම ත්‍යාගය යේසුස්වහන්සේය.

© ඉංග්‍රීසි 1970 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය.
© සිංහල 1982 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය.

### ඔබගේ අභ්‍යාසය සඳහා

මෙහි පහත සඳහන් ප්‍රශ්නය යටතේ පිළිතුරු තුනක් දී ඇත. සුදුසුයයි ඔබ සිතන පිළිතුර පසකින් X ලකුණ යොදන්න.

1. ඔබ ලබාගැනීමට වඩාත්ම කැමති කුමක්ද?

... (අ) ධනය
... (ආ) ජනප්‍රියත්වය
... (ඇ) මා හට සදාකාල ප්‍රීතිය ලබා දෙන මිතුරෙක්.

# දෙවියන්වහන්සේගේ පොරොන්දුව

ඇත්ත වශයෙන්ම මේ උතුම්ම ත්‍යාගය ලබාගන්නේ කෙසේදැයි දැන ගන්නට ඔබ කැමැත්තෙන් සිටී. දෙවියන් වහන්සේ තම අනගි පොතවන බයිබලය තුලින් ඔබට මෙය ගැන ප්‍රකාශ කරන සේක. එය ලියූ මනුෂ්‍යයන්ට එහි ලිවිය යුත්තේ මොනවාදැයි දෙවියන්වහන්සේ පැවසූ නිසා අපි එයට''දේව වචනය'' යයි කියන්නෙමු.



යේසුස්වහන්සේගේ උත්පත්තියට අවුරුදු සිය ගණනකට පෙර සිදුවීමට යන දේ අනාගතවක්තෘවරුන්ට දෙවියන් වහන්සේ පැවසූ සේක. ඔවුහු දෙවියන් වහන්සේගේ පණිවුඩ හෙවත් අනාවැකි බයිබලයෙහි පළමු කොටසෙහි ලියූහ. දෙවියන්වහන්සේ තම පුත්‍රයා ලෝකයේ ගැළවුම්කාරයාණන් වීම පිණිස එවන්ට පොරොන්දු වූ සේක. අනාගත වක්තෘවරු ඒ ගැන මෙසේ ලියූහ.

- ගැළවුම්කාරයාණන් බෙත්ලෙහෙමේ උපදින බව.
- ගැළවුම්කාරයාණන් කන්‍යාවකගෙන් බිහිවන බව.
- ගැළවුම්කාරයාණන් දාවිත්ගේ වංශයේ කෙනෙකු වන බව.

### ඔබගේ අභ්‍යාසය සඳහා

2. දෙවියන්වහන්සේ ගැළවුම්කාරයාණන් ගැන ප්‍රකාශ කරන්නේ කුමන පොතේද?...........

3. ඔබට බයිබලයක් හෝ ඉන් කොටසක් හෝ තිබේද? ..........................................

# දේව දූතයා සහ මරියා

යේසුස් වහන්සේගේ උත්පත්තියට වසර 675 පමණ පෙර අනාගතවක්තෘවර යෙසායා මෙසේ ලියන ලදී.

බලව කන්‍යාව ගර්භනීව පුත්‍රයකු වදා එම්මානුවෙල් යන නම ඔහුට තබන්නීය. යෙසායා 7:14



එම්මානුවෙල් යනු ''දෙවියන්වහන්සේ අප සමහය'' යන්නයි. අවසාන යේදී දෙවියන්වහන්සේගේ මෙම පොරොන්දුව සැබෑවීමේ කාලය පැමිණියේය. දැනට අවුරුදු 2000 කට පමණ පෙර දෙවියන්වහන්සේගේ පණිවුඩයක් රැගත් දූතයෙකු ස්වර්ගයේ සිට පොළවට මරියා නැමැති යෞවනියක වෙත යවන ලදී. ලූක් නම් වෛද්‍යවරයා මරියාගේ මෙම අත්දැකීම පිළිබඳ බයිබලයේ මෙසේ ලියන ලදී. එනම්;

ගලීලයේ නාසරෙත් නම් නුවරක විසූ, දාවිත්ගේ වංශයේ වූ යෝසෙප් නම් මනුෂ්‍යයෙකුට විවාහ බස්දී සිටි කන්‍යාවක වෙතට දෙවියන්වහන්සේ වෙතින් ගාබ්‍රියෙල් නම් දූතයා යවන ලද්දේය. ඒ කන්‍යාවගේ නාමය මරියාය. දූතයා ඈ සිටි තැනට පැමිණ: ''බොහෝ කරුණාව ලැබූ තැනැත්තිය, ශුභ සිද්ධ වේවා! ස්වාමීන්වහන්සේ නුඹ සමග සිටින සේකැයි'' කීවේය.

නමුත් ඈ ඔහුගේ කීමට බොහෝසේ කැලඹී, මේ කෙබඳු වූ ආචාරයක්ද කියා කල්පනා කරමින් සිටියාය. දේවදූතයා ඈට කථා කොට: ''මරියා භය නොවන්න. මක්නිසාද නුඹට දෙවියන් වහන්සේගෙන් කරුණාව ලැබුණේය. බලව, නුඹ ගර්භණීව පුත්‍රයකු වදන්නීය, උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න. උන්වහන්සේ උතුම්වූ මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝයයි·කියනු ලබන සේක. උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවිවූ ස්වාමීන්වහන්සේ උන්වහන්සේට දෙනසේක. උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලේටම රජකම් කරන සේක. උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර නො වන්නේ''යයි කීවේය.

එවිට මරියා දේවදූතයාට කථාකොට: ''මා පුරුෂයෙකු නැඳින සිටින බැවින්, මේක වෙන්නේ කෙසේදැයි'' කීවාය. දේවදූතයා ඈට උත්තර දෙමින්: ''ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ ආනුභාවයද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්නට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක''යි කීවේය. මරියාද: ''බැලුව මැනව, ස්වාමීන්වහන්සේගේ දාසිය; ඔබගේ වචනය ලෙස මට වේවා''යි කීවාය. එවිට දේවදූතයා ඈ කෙරෙන් ගියේය. ලූක් 1:26-38.

ස්වාමීන්වහන්සේ'' යනු දෙවියන්වහන්සේට භාවිතාකරන තවත් නාමයකි. සිදුවන්නට යන දේ ගැන මරියාට නොවැටහුනු නමුත් ස්වාමීන්වහන්සේගේ විශ්වාසදායක දාසියක වශයෙන් උන්වහන්සේ ඉල්ලන ඕනෑම දෙයක් කිරීමට ඇය සූදනම්ව සිටියාය.

**ඔබගේ අභ්‍යාසය සඳහා**

4. යේසුස්වහන්සේගේ මව වීමට කවරෙකු තෝරා ගත්තේද?

.................................................................

# මරියා සහ එලිසබෙත්

දේවදූතයාගේ පණිවුඩයෙන් පසු වැඩිකලක් ගතවන්නට පෙර මරියාගේ ශරීරය තුල හාස්කමක් සිදුවූ බව ඇයට වැටහිනි. ඇ භූමික පියෙකු නොමැතිව දරුවෙකු ලැබීමට සිටියාය. ගැළවුම්කරු වන උන්වහන්සේගේ පුත්‍රයාගේ මව වීමට දෙවියන්වහන්සේ ඇයව තෝරාගත්සේක. නමුත් මරියා විශාල ගැටළුවකට මුහුණ පෑවාය. ඇයට සිදුවූ දේ ගැන කවරෙක් විශ්වාස කරත්ද? වඩුවෙක් වූ යෝසෙප් නම් යහපත් මනුෂ්‍යයෙකුට ඇ විවාහබස්දී සිටියාය. ඇ ගර්භනීවූ බව දැනගත් විට ඔහු කුමක් සිතන්නේද? ඇය අනාචාරයේ හැසිරුනේ යයි චෝදනා කළේ නම් ඇයට ගල් ගසා මරන්නට ඉඩ තිබේ. දූන් ඇය කුමක් කළ යුතුද?



මරියාගේ නෑනාවූ එළිසබෙත්ට දෙවියන් වහන්සේ කළ හාස්කමක් ගැන දූතයා කියා තිබුණි. එබැවින් ඇයට මෙය වැටහේ යයි සිතාගෙන මරියා එළිසබෙත් සහ ඇගේ පුරුෂයාවූ සෙකරියස්ගේ නිවසට ගොස් මාස තුනක් එහි නැවතී සිටියාය.

එළිසබෙත් ශුද්ධාත්මයෙන් පූර්ණව මහත් ශබ්දයකින් හඬනගා කියන්නී: ''නුඹ ස්ත්‍රීන් අතරෙහි ආශිර්වාද ලද්දීය. නුඹේ ගර්භයේ ඵලයද ආශිර්වාද ලද්දේය. මාගේ ස්වාමීන්වහන්සේගේ මෑණියන් මා ළඟට පැමිණීම කෙසේ සිද්ධවීද?''

එවිට මරියා කියන්නී: ''මාගේ සිත ස්වාමීන්වහන්සේ වර්ණනා කෙරෙයි, මාගේ ආත්මයද මාගේ ගැළවුම්කාර දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රීතිමත් විය. මක්නිසාද උන්වහන්සේ ස්වකීය දාසියගේ පහත් කම බැලූසේක. බලව, මෙතැන් පටන් සියලූ පරම්පරාවෝ මට ආශිර්වාද ලද්දීයයි කියන්නෝය. මක්නිසාද බලවත්වූ තැනන්වහන්සේ මට මහත් දේ කළසේක'' කීවාය. ලූක් 1:42-43,46-49

මරියා දෙවියන්වහන්සේගේ වචනය දැනගෙන සිටියාවූ, උන්වහන්සේට නමස්කාර කළාවූ රූමත් තරුණ කාන්තාවක් වූවාය. ඇ නැණවත්, ආචාරශීලී, විශ්වාසවන්ත, කීකරු, නිහතමානී, යහපත් තරුණියක් වූවාය. ගැළවුම්කාරයාණන් මෙලොවට ගෙන එන පිණිස ඇයගේ පංගුකාරකමට අපි ඇයට කෘතඥවෙමු. ගැළවුම්කාරයාණන්ගේ මව වීමට දෙවියන්වහන්සේ මරියා තෝරාගත් බව එළිසබෙත් සහ දේවදූතයා හඳුනාගත්තෝය. නමුත් ඔවුහු ඇයට නමස්කාර නොකළහ. අපිද නොකරමු. මරියතුමිය දෙවියන්වහන්සේ ඇගේ ගැළවුම්කරු යයි පැවසුවාය.

**ඔබගේ අභ්‍යාසය සඳහා**

5. මරියාගේ ඥාතිවරියගේ නම කුමක්ද?

..................................................

# දේව දූතයා සහ යෝසෙප්

මරියා ගර්භනීව සිටින බව දැනගත් කල යෝසෙප් කුමක් කළේද?

ඇ විවාහ බස්දී සිටි යෝසෙප් නිතරම යුක්ති ගරුකව කටයුතු කළ මනුෂ්‍යයෙක්ව සිටි හෙයින් මරියාව ප්‍රසිද්ධියේ නින්දාවට පත්කිරීමට අකමැතිව රහසින් විවාහ ගිවිසුම කඩකිරීමට සිතාගත්තේය. ඔහු මේ කාරණා ගැන කල්පනා කරමින් සිටියදී ස්වාමීන්වහන්සේගේ දූතයෙකු ස්වප්නයකින් ඔහුට පෙනී මෙසේ කීවේය. ''දාවිත්ගේ පුත්‍රවූ යෝසෙප්, නුඹේ භාර්යාව කොට මරියා පාවාගන්න භය නොවන්න. මක්නිසාද ඇ තුළ පිළිසිඳුනාවූ යමක් ඇද්ද එය ශුද්ධාත්මයාණන් කරණකොටගෙනය. ඇ පුත්‍රයකු වදන්නීය. උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න. මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාප වලින් ගළවන්නේ උන්වහන්සේය''යි කීවේය.



එවිට යෝසෙප් නින්දෙන් පිබිද, ස්වාමීන්වහන්සේගේ දූතයා ඔහුට අණකළ ලෙස කරනුයේ, මරියාව පාවාගත්තේය. නමුත් ඇ පුත්‍රයකු වදන තුරු ඔහු ඇ නොහැඳින්නේය. ඔහු උන්වහන්සේට යේසුස් යන නාමය තැබීය. මතෙව් 1:19-19, 24, 25

**ඔබගේ අභ්‍යාසය සඳහා**

6. දේවදූතයා යෝසෙප්ට කුමක් කීවේද?
   ... (අ) විවාහ ගිවිසුම කඩ කිරීමට.
   ... (ආ) මරියාගේ ළදරුවා ශුද්ධාත්මයාණන් කරණකොටගෙන බැවින් ඇයව විවාහ කරගන්නා ලෙස.
   ... (ඇ) මරියාව අමතක කර දමන ලෙස.

# බෙත්ලෙහෙමේ ඉපදීම

එකල ජනලේඛණයක් ගැනීම පිණිස සියල්ලන්ම ලියාපදිංචි වියයුතු බවට කායිසර් අගෝස්තුස් නියෝගයක් පැනවීය. මරියා සහ යෝසෙප් දාවිත්ගේ පෙළපතේ අයවූ නිසා ලියාපදිංචි වීම පිණිස දාවිත්ගේ නුවර වන බෙත් ලෙහෙමට ගියහ. අනාගතවක්තෘවර මීකා පවසා තිබුණේ ගැළවුම්කාරයාණන් එහිදී උපදින බවය. මරියාට සහ යෝසෙප්ට තානායමේ ඉඩ නොතිබිණි. ඔවුහු ගවහලක රැකවරණය ලබා ගත්හ. යේසුස් වහන්සේ එතැනදී උපන්සේක. දේව දූතයෙක් ඒ අසල සිටි එඬේරුන්ට එම ශුභාරංචිය ප්‍රකාශ කලේය.



''භය නොවෙල්ලා මුළු සෙනඟට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි. මක්නිසාද ස්වාමිවූ ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් නුඹලාට දාවිත්ගේ නුවර අද රෑ උපන්සේක. රෙදි වලින් ඔතා ගවයන් කන ඔරුවක බාවා ඉන්න ළදරුවෙක් නුඹලාට සම්භවේ. මේක නුඹලාට ලකුණය''යි කීවේය.

එකෙණෙහිම දේවදූතයා සමඟ මහත් ස්වර්ගිය සේනා සමූහයක් දෙවියන්වහන්සේට ප්‍රසංසා කරමින් ''ඉතා උසස්තැන්හි දෙවියන්වහන්සේට මහිමයද පොළොවෙහි උන්වහන්සේට ප්‍රියවූ මනුෂ්‍යයන් අතරෙහි සමාදානයද වේවා''යි කීවෝය. ලූක් 2: 10–14.

ගව ඔරුවක් තුළ සැතපී උන් ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේ එඬේරුන්ට හමුවිය. දෙවියන් වහන් සේගේ මෙම උතුම් ත්‍යාගය ගැන ඔවුහු දෙවියන්වහන්සේට ප්‍රසංසා කළහ. යේසුස්වහන්සේට නමස්කාර කරන පිණිස වෙනත් රටවලින් පඬිවරු කීපදෙනෙක්ද පැමිණියහ. ඉන් පසු හෙරොද් නම් දුෂ්ඨ රජ යේසුස්වහන්සේව මරුමුවට පත් කිරීමට තැත්කලෙන් මරියා සහ යෝසෙප් උන්වහන්සේ සමඟ මිසරයට පළා ගියෝය. පසුව ඔවුහු ආපසු නාසරෙත් නුවරට ගියහ. යේසුස්වහන්සේ එහි වැඩුනුසේක.

## ඔබගේ අභ්‍යාසය සඳහා

7. දෙවියන්වහන්සේගේ උසස්ම ත්‍යාගය කුමක්ද?

... (අ) ප්‍රීතිය

... (ආ) නිරෝගිභාවය

... (ඇ) අපට සදාකාල ජීවනය දෙන්නාවූ ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ.

## ශුභ පැතුම්

ඔබ පළමුවෙනි පාඩම අවසන් කර ඇත. දැන් ඔබේ ලිපිනය මෙම පොත් පිංචෙහි ලියා පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න. නියමිත තැපැල් ගාස්තුව ලියුම් කවරයේ යෙදීමට අමතක නොකරන්න. අපි ඔබේ පාඩම ශ්‍රේණිගත කර දෙවැනි පාඩම සමඟ ආපසු එවන්නෙමු.

ඔබේ නම:...........................................

ලිපිනය:...........................................

...................................................

දිස්ත්‍රික්කය:.....................................

වයස:.................... ස්ත්‍රී පුරුෂ භාවය.........

අපේ ලිපිණය

**ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය**

**තැ. පෙ. 102**

**කොළඹ**

සීමාසහිත ඉවැන්ජල් මුද්‍රණාලය 490/8 හැව්ලොක් පාර කොළඹ 6.